# සාමාන්‍ය සමයේ විසිපස්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

හග්ගයි දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

හග්ගයි 1 : 1-8

"දේව මාළිගාව නැවත ගොඩ නගන්න."

"දාරියුස් රජුගේ දෙවන අවුරුද්දේ හය වන මාසයේ පළමු වනදා සමිඳාණන් වහන්සේ දිවැසිවර හග්ගයි මගින් ෂෙයල්තියෙල්ගේ පුත් ජුදාහි ආණ්ඩුකාර සෙරුබාබෙල් වෙතටත්, ජෙහෝදාශාක්ගේ පුත් උත්තම පූජක ජෝෂුවා වෙතටත් එවූ පණිවුඩය මෙය වේ. "දේව මාළිගාව නැවත ගොඩ නැගීමට තිසි කාලය පැමිණ ඇතැ යි මේ සෙනඟ කියති" යි සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරණ සේක. එවිට මේ පණිවුඩය දිවැසිවර හග්ගයි මගින් උන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

"මාගේ ජනයෙනි, මාගේ දේව මාළිගාව නටබුන්ව තිබිය දී නුඹලා මනහර මන්දිරවල ජීවත් වීම සුදුසු ද? දැන් ඉතින් සර්ව පරාක්‍රම සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. නුඹලාගේ ජීවිත පිළිවෙළ ගැන සිතා බලන්න. නුඹලා බොහෝ සේ වපුළ නමුත්, ලබා ගත් අස්වැන්න සුළු ය. කන නමුත් තෘප්තියක් නුඹලාට නැත. බොන නමුත් සෑහීමක් නැත. අඳින නමුත් උණුසුමක් නැත. මුදල් හම්බ කරන්නා, එය හම්බ කරන්නේ හිල් ඇති පසුම්බියකට දමන්ට ය. සර්ව පරාක්‍රම සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. නුඹලාගේ ජීවිත පිළිවෙළ ගැන සිතා බලන්න. කඳුකරයට ගොස් ලී ගෙනවුත් මා ප්‍රසන්න වන පිණිස මට තිසි නමස්කාරය ලැබෙන පිණිස ද දේව මාළිගාව නැවත ගොඩනගන්න.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 149 : 1-6, 9

පිළිතුර: සමිඳාණෝ සිය සෙනඟ කෙරෙහි ප්‍රසන්න වන සේක.

ගීය: සමිඳුන් පසසන්න. සමිඳුන්ට නව ගීතිකාවක් ද සැදැහැවතුන්ගේ
සභාවේ දී එතුමන්ගේ පැසසුම් ද ගායනා කරන්න.
තමන් මැවූ සමිඳාණන් කෙරෙහි ඉශ්රායෙල් ප්‍රීති වෙත්වා!
තමන්ගේ රජුන් කෙරෙහි සියොන්හි දරුවෝ ප්‍රීතිමත් වෙත්වා!

එතුමන්ගේ නාමයට රඟපාමින් පැසසුම් කරත්වා! රබන් ගසා වීණා
වයා එතුමන්ට පසස් ගී ගයත්වා.
සමිඳාණෝ සිය සෙනඟ කෙරෙහි ප්‍රසන්න වන සේක.
දීනයන් ජය සිරියෙන් සරසන සේක.

සැදැහැවත්හු මහිමයේ යුක්තව ප්‍රීති වෙත්වා! මුළු රැය එතුමන්
නමදිමින් ප්‍රීතියෙන් ගායනා කරත්වා.
සිය මුවින් සමිඳුන්ට පැසසුම් කරත්වා!
මේ ගෞරවය එතුමන්ගේ සියලු සැදැහැවතුන්ට ඇත්තේය.
සමිඳුන්ට ප්‍රශංසා වේවා!

# සුබ පුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, අපි මිහිපිට මඳ කලකට ජීවත් වන්නන් වෙමු.
ඔබගේ ආඥාවන් අපෙන් නොසැලවූව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස, කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේ ය"යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 9: 7-9

"මම ජොහාන්ගේ හිස සිඳ දැමීමි. එහෙත් මෙබඳු දේ කරන තැනැත්තා කවරෙක් ද?."

යුව රජ හෙරෝද්, ජේසුස් වහන්සේ කළ සියල්ල අසා අතිශයින් වියවුල් විය. එසේ වූයේ, "ජුවාම් මළවුන් කෙරෙන් උත්ථාන විය" කියාත්, සමහරුන්, "එලියා පහළ වූයේය" කියාත්, අන් සමහරුන් "පෙර සිටි දිවැසිවරයන් ගෙන් කෙනෙක් උත්ථාන වීය" කියාත් කී බැවිනි.

එවිට හෙරෝද් "මම ජුවාම්ගේ හිස සිඳ දැමීමි. එහෙත් මට සැළ වී ඇති මෙබඳු දේ කරන මේ තැනැත්තා කවරෙක්දැ"යි ඇසීය. ඔහු උන්වහන්සේ දැකීමට වෑයම් කළේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.